**ඒරාවූර් නගර සභාව**

**-----------------------**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 18 දින විගණයට ඉදිරිපත් කර තිබූ අතර විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර 29 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ඒරාවූර් නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු රු.86,650 ක් වූ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබූ පහත දැක්වෙන විෂයයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබිණි.

| | විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (i) | ඉඩම් හා ගොඩනැගිලි | 85,739,626 | ඉඩම් හිමිකම් ඔප්පු |
| (ii) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 4,107,929 | ස්ථාවර වත්කම් ලේඛන |
| (iii) | මෝටර් වාහන | 2,492,615 | |
| (iv) | ලී බඩු | 3,289,978 | |

### 1.3.3 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 177(2) වගන්තිය | 2014 වර්ෂය සඳහා වූ සභාවේ මූල්‍ය ප්‍රකාශන සාරාංශය රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමට 2015 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2009 සැප්තැම්බර් 18 දිනැති අංක PF/437 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වාහනවල රක්ෂණ සහතික ජාතික රක්ෂණ භාර අරමුදලෙන් හෝ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලබාගත යුතු වුවත් ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේ වාහන 03 කට අදාල රක්ෂණ සහතික පුද්ගලික රක්ෂණ ආයතනවලින් රු.169,410 ක මුදලක් ගෙවා ලබාගෙන තිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග යනාදිය ලේඛනගත කිරීමට පරිගණක ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම් රු. 258,607 කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම් රු. 402,649 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.144,042 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 2.2 ආදායම් කළමනාකරණය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම සහ තථ්‍ය ආදායම පහත දැක්වෙන පරිදිය.

| ආදායම් වර්ගය | 2015 වර්ෂයට ඇස්තමේන්තුගත | 2015 වර්ෂයේ රැස්කරන ලද මුදල | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) |
| වරිපනම් සහ බදු | 2,250,000 | 2,070,430 | 9,729,786 |
| මස්කඩ බදු | 1,250.807 | 1,367,037 | 1,953,970 |
| මස්කඩ බදුකුලී | 400,000 | 593,700 | 3,588,115 |
| විනෝද බදු | 125,000 | 166,270 | 949,490 |

**2.2.2 වරිපනම් සහ බදු**

--------------------

නගරසභා ආඥා පනතේ (255 අධිකාරිය) 160 වගන්තිය පරිදි නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම්, ඉදිකරනු ලැබූ නිවාස සහ ගොඩනැගිලි යනාදිය වෙනුවෙන් 2010 වර්ෂයේ සිට 2015 වර්ෂයේ අවසානය දක්වා අයවිය යුතු මුළු වරිපනම් හිඟ ශේෂය රු.9,729,786 ක් අය කර නොතිබුණි.

**2.2.3 සිනමා ශාලා බදු**

-------------------

එක් සිනමා ශාලාවකින් 2013 සහ 2014 වර්ෂවල දී අය විය යුතු විනෝද බදු හිඟ මුදල වූ රු.178,299 ක් අය කර ගැනීමට සභාව ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේ දී රාජ්‍ය පරිපාලන, පළාත් සභා ,පළාත් පාලන සභා සහ යහපාලන අමාත්‍යාංශය මඟින් පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු ටිපර්, Short Wheel Base Crew Cab, බැක්කෝ ලෝඩර් යනාදියේ හිමිකම සභාවේ නමින් හරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවට අයත් ට්‍රැක්ටරයක් ද, ලෑන්ඩ් මාස්ටරයක් ද අවුරුදු පහකට වඩා අබලන් තත්ත්වයක පවතී. ඒවා අළුත්වැඩියා කර පාවිච්චියට ගැනීමට හෝ වෙන්දේසියේ විකිණීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) අවස්ථා 76 ක දී නොයෙකුත් අවශ්‍යතා සඳහා නගර සභා සේවකයනට ලබා දී ඇති රු.341, 287 ක අත්තිකාරම් මුදල් ආපසු අය කර ගැනීමට අවුරුදු 14 ක් තිස්සේ කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

**4. යහ පාලනය සහ ගිණුම් කටයුතු**

----------------------------------

**4.1 අයවැය පාලනය**

--------------------

අය වැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 51% සිට 238% දක්වා වූ ප්‍රතිශතයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) ආදායම් කළමනාකරණය

(ඈ) අය වැය පාලනය